# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 1494/22 – 2007 අප්‍රේල් 27 වැනි සිකුරාදා – 2007.04.27

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභාවේ 2006 අංක 4 දරන ක්‍රීඩා ප්‍රඥප්තිය.

සංශෝධන සටහන් කළේ : 2006.12.21
අනුමැතිය ලැබුණේ : 2007.04.04

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

ශ්‍රියානි පද්මලතා,
සභා ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
සබරගමුව පළාත් සභාව.

සබරගමුව පළාත් සභාවේ 2006 අංක 04 දරන ක්‍රීඩා ප්‍රඥප්තිය

සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයා අනුමත කළ දිනය : 2007 අප්‍රේල් 04

පළාත් ක්‍රීඩා මණ්ඩලය, දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩල සහ ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩල පිහිටුවීම සඳහා ද ක්‍රීඩා ශිෂ්‍යත්ව ඇති කිරීම සඳහා ද ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම සහ ඒවා පරිපාලනය කිරීම සඳහා ද ක්‍රීඩා ශිෂ්‍යත්ව සහ ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම සඳහා ද ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය සුබ සාධක කටයුතු සැලැස්වීම සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ, පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ.

I වන කොටස

1. මේ ප්‍රඥප්තිය සබරගමුව පළාතේ පළාත් සභාවේ 2006 අංක 04 දරන ක්‍රීඩා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණ දින සිට ක්‍රියාත්මක වන්නේය. කෙටි නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය

පළාත් ක්‍රීඩා මණ්ඩලය ආදිය පිහිටුවීම

2. මේ ප්‍රඥප්තියෙහි දක්වා ඇති කාර්ය සඳහා මතු දැක්වෙන විධිවිධානවලට අනුකූලව.—

(1) පළාත් ක්‍රීඩා මණ්ඩලයක්,

(2) දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලයක්,

(3) ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලයක්,

(4) අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ක්‍රීඩා ශිල්පායතන සංඛ්‍යාවක්, සහ

(5) "සබරගමුව" "ක්‍රීඩා ශිෂ්‍යත්ව" යනුවෙන් හඳුන්වනු ලබන ශිෂ්‍යත්වයක් පිහිටුවනු ලබන්නේය.

පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂවරයා සහ වෙනත් නිලධරයන් පත්කිරීම

3. (1) මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂවරයෙක් ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලබන්නේය.

(2) මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා අවශ්‍යවන සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂවරු සහ වෙනත් නිලධරයන්ද කලින් කල ආණ්ඩුකාරවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ අධිකාරියට පත් කරනු ලැබිය හැක.

(3) මේ වගන්තියේ (1) සහ (2) වන උපවගන්ති යටතේ පත් කරනු ලබන සියළුම නිලධරයන් ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ කාර්යයන් සඳහා සහ එහි අර්ථානුකූලව රජයේ නිලධරයන් ලෙස සලකනු ලබන්නේය.

(4) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ක්‍රියා කරමින් යම් නිලධරයකු විසින් සද්භාවයෙන් කරන ලද දෙයක් සම්බන්ධයෙන් හෝ සද්භාවයෙන් යම් දෙයක් නොකර හැරීම් සම්බන්ධයෙන් හෝ ඔහුට විරුද්ධව කිසිම අධිකරණයක නඩුවක් පැවරිය නොහැකි වන්නේය.

(5) මේ වගන්තිය යටතේ පත් කරන ලද සියළුම නිලධරයන් විසින් තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ තම කාර්යය ඉටුකිරීමේ දී අමාත්‍යවරයා විසින් නියත් කරනු ලබන පොදු හෝ විශේෂ විධානවලට යටත් වන්නේය.

II වන කොටස

*සබරගමුව පළාත් ක්‍රීඩා මණ්ඩලය, දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩල හා ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලය පිහිටුවීම*

සබරගමුව පළාත් ක්‍රීඩා මණ්ඩල පිහිටුවීම

4. (1) සබරගමුව පළාතේ ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය දියුණු කිරීම, සංවර්ධනය කිරීම සහ ඒ පිළිබඳව උනන්දු ඇති කිරීම සඳහා අමාත්‍යවරයාට උපදෙස් දීම පිණිස (මෙහි මින් මතු මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන) 'සබරගමු පළාත් ක්‍රීඩා මණ්ඩලය' යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් ගැසට් පත්‍රයේ අමාත්‍යවරයා විසින් පළ කරනු ලබන නියමයක් මගින් පිහිටුවනු ලැබිය හැකිය.

(2) මණ්ඩල පහත දැක්වෙන නිලධරයන්ගෙන් සංයුක්ත වන්නේය.—

(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් පස් දෙනෙකු (අමාත්‍යවරයා විසින් මේ පස්දෙනා අතුරෙන් එක් කෙනෙකු සභාපතිවරයා ලෙස නම් කරනු ඇත.)

(ආ) පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂවරයා,

(ඇ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා,

(ඈ) පළාත් තරුණ සේවා අධ්‍යක්ෂවරයා,

(ඉ) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා,

(ඊ) පළාතේ දිස්ත්‍රික් ලේකම්වරුන්.

(3) පළාතේ ක්‍රීඩා අධ්‍යක්ෂවරයා මණ්ඩලයේ ලේකම්වරයා වන්නේය.

මණ්ඩල බලතල කර්තව්‍ය හා කාර්යය

5. මණ්ඩල බලතල, කර්තව්‍ය, මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව, අමාත්‍යවරයා විසින් පළාතේ පළාත් සභාවට ඉදිරිපත්කර අනුමත කිරීමෙන් පසු මෙම විසි රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ වන්නේය. ගැසට් කිරීමෙන් පසු බලාත්මක වන්නේය.

*රීති*

06. මණ්ඩලයේ රැස්වීම්වල කාර්ය පටිපාටිය හා ගණ පූර්ණය සම්බන්ධයෙන් සහ ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා අමාත්‍යවරයා විසින් රීති සැදිය හැකිය.

*දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩල*

07. (1) සබරගමුව පළාතේ දිස්ත්‍රික්කවල ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය දියුණු කිරීම සහ ඊට උනන්දුව ඇති කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම පිණිස අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි, එකී එක් එක් දිස්ත්‍රික්කය සඳහා (මෙහි මින්මතු "ක්‍රීඩා මණ්ඩල" යනුවෙන් සඳහන් කරනු ලබන) දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩලයක් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් පිහිටුවනු ලැබිය හැකිය.

(2) ක්‍රීඩා මණ්ඩලය පහත දැක්වෙන නිලධරයන්ගෙන් සංයුක්ත වන්නේය :

(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් සිදෙනෙකු. (අමාත්‍යවරයා විසින් මේ සිදෙනා අතුරින් එක් කෙනෙකු සභාපතිවරයා ලෙස නම් කරනු ඇත.)කි

(ආ) සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයා (ශාරීරික අභ්‍යාස),

(ඇ) දිස්ත්‍රික් ක්‍රීඩා නිලධරයා,

(ඈ) දිස්ත්‍රික් තරුණ සේවා නිලධරයාකී, සහ

(ඉ) 19 වන වගන්තිය අනුව ලියාපදිංචි කරනු ලබන එක් එක් ක්‍රීඩා සංගමයන් සියල්ලම වෙනුවෙන් නියෝජිතයෙක්,

(ඊ) ප්‍රාදේශීය ක්‍රීඩා සමාජවලින් දිස්ත්‍රික් ක්‍රීඩා සමාජ නියෝජනය වීම සඳහා තෝරා පත්කර ගන්නා නියෝජිතයින් පස්දෙනෙකු.

(3) දිස්ත්‍රික් ක්‍රීඩා නිලධරයා ක්‍රීඩා මණ්ඩලයේ ලේකම්වරයා වන්නේය.

*ක්‍රීඩා මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යය*

08. ක්‍රීඩා මණ්ඩලයේ බලතල කර්තව්‍ය මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව, අමාත්‍යවරයා විසින් පනවන නියෝග මගින් නියම කරනු ලැබිය හැකිය.

*රීති*

09. ක්‍රීඩා මණ්ඩලයේ රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ ගණ පූර්ණය සම්බන්ධයෙන් හා රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා අමාත්‍යවරයා විසින් රීති සැදිය හැකිය.

*ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩල*

10. (1) සබරගමුව පළාතේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ක්‍රීඩා සහ ශාරීරික අභ්‍යාස අධ්‍යාපනය දියුණු කිරීම සහ ඊට උනන්දුව ඇති කිරීම සම්බන්ධයෙන් අදාළ ක්‍රීඩා මණ්ඩලයට උපදෙස් දීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස, අමාත්‍යවරයා විසින් කරනු ලබන පරිදි, එක් එක් ප්‍රාදේශීය කොට්ඨාසය සඳහා ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලයක් පිහිටුවනු ලැබිය හැකිය.

(2) ඒ ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලය පහත දැක්වෙන නිලධාරීන්ගෙන් සමන්විත වන්නේය :

(අ) අදාළ කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා,

(ආ) අදාළ කොට්ඨාසයේ ක්‍රීඩා නිලධරයා,

(ඇ) අදාළ කොට්ඨාසයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා,

(ඈ) අදාළ කොට්ඨාසයේ තරුණ සේවා නිලධරයා,

(ඉ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් හතර දෙනෙක් ; සහ

(ඊ) මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සීමා ඇතුළත ලියාපදිංචි කරනු ලබන එක් එක් ක්‍රීඩා සමාජ අතුරින් නියෝජිතයන් පස් දෙනෙක් (සියළු ක්‍රීඩා සමාජ වෙනුවෙන් 5 දෙනෙක්).

(3) ඇමතිවරයා විසින් පත් කරනු ලබන හතරදෙනා අතුරින් එක් අයෙකු ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලයේ සභාපතිවරයා වන්නේය.

(4) අදාළ කොට්ඨාසයේ ක්‍රීඩා නිලධරයා එම ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලයේ ලේකම්වරයා වන්නේය.

ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලවල බලතල, කර්තව්‍ය හා කාර්යය

11. (1) ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලයක බලතල, කර්තව්‍ය සහ කාර්යය මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව අමාත්‍යවරයා විසින් පනවන නියෝග මඟින් නියම කරනු ලැබේ.

(2) ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලයක රැස්වීම්වල කාර්ය පටිපාටිය හා ගණපූර්ණය සම්බන්ධයෙන් සහ එම රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා එකී ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩල විසින් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත් රීති සැදිය හැකිය.

සාමාජිකයන්ගේ ධුර කාලය

12. (1) මේ ප්‍රඥප්තියේ 4, 7 සහ 10 වන වගන්ති යටතේ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන යම් සාමාජිකයෙකු මියයාම, ඉල්ලා අස්වීම, ඉවත්කරනු ලැබීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා අවස්ථාවෝචිත පරිදි ඒ මණ්ඩලයේ, ක්‍රීඩා මණ්ඩලයේ ප්‍රාදේශීය ක්‍රීඩා මණ්ඩලයේ කලින් යම් පුරප්පාඩුවක් ඇතිවුවහොත් මිස, ඒ සාමාජිකයා පත් කරනු ලැබූ දින සිට තුන් අවුරුද්දක් වූ කාල සීමාවක් ධුරය දරන්නේය.

(2) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන යම් සාමාජිකයෙකු ඉවත් කිරීම යෝග්‍ය බව අමාත්‍යවරයාගේ මතය වුවහොත්, අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කළ හැකිය.

(3) අමාත්‍යවරයා විසින් පත් කරන ලද යම් සාමාජිකයෙකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ ඔහුගේ ධුරය හිස් වූ විට ඒ සාමාජිකයා වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තෙක් ඒ සාමාජිකයාගේ ධුර කාලය ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය සඳහා පමණක් ධුරය දරන්නේය.

(4) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයකුගේ ධුරය, කාලය ඉකුත්වීමෙන් හිස් වූ අවස්ථාවක ඒ සාමාජිකයා නැවත පත් කරනු ලැබීමට සුදුසු වන්නේය.

(5) අමාත්‍යවරයා විසින් පත් කරන ලද යම් සාමාජිකයෙකු රෝගාතුර වීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා තම ධුරයේ කාර්යය ඉටු කිරීමට ඔහුට තාවකාලිකව නොහැකි වුවහොත් සාමාජිකයෙකු වශයෙන් ඔහු වෙනුවෙන් වැඩ බැලීමට වෙනත් යම් තැනැත්තෙකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

නුසුදුසුකම්

13. පහත දැක්වෙන තැනැත්තන් 4, 7 හෝ 10 වන වගන්ති යටතේ සාමාජිකයෙකු ලෙස අමාත්‍යවරයා විසින් පත් කිරීමට නුසුදුස්සෙකු වන්නේය :

(1) සිහි විකල තැනැත්තෙකු ලෙස ශ්‍රී ලංකාවේ නීති බලය සහිත අධිකරණයක් විසින් තීරණය කරනු ලැබ සිටින හෝ විනිශ්චය කරනු ලැබ සිටින තැනැත්තෙක්.

(2) නීති බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බන්කොලොත් තැනැත්තෙකු ලෙස විනිශ්චය කරනු ලැබූ තැනැත්තෙක්.

(3) අමාත්‍යවරයාගේ මතය අනුව යම් දුෂ්ට හා අවිනීත හැසිරීමකට හෝ කටයුතු කිරීමක් සහිත වරදකට යම් නීති බලය සහිත අධිකරණයක දී වරදකරු කරනු ලැබූ තැනැත්තෙක්.

සබරගමුව ක්‍රීඩා අරමුදල පිහිටුවීම

14. (1) සබරගමුව පළාතේ ක්‍රීඩා කටයුතු උනන්දු කරවීම දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා, (මෙහි මින්මතු 'ක්‍රීඩා අරමුදල' යනුවෙන් සඳහන් කරනු ලබන) 'සබරගමුව ක්‍රීඩා අරමුදල' යනුවෙන් හඳුන්වන පළාත් සභා අරමුදලෙන් පවත්වාගෙන යා යුතු වෙනම ගිණුමක් පිහිටුවනු ලබන්නේය.

(2) 1987 අංක 42 දරන පළාත් සභා පනතේ III වන කොටසේ විධිවිධානවලට ක්‍රීඩා අරමුදල යටත් වන්නේය.

(3) පහත සඳහන් ලැබීම් ප්‍රථමයෙන් පළාත් සභා අරමුදලට ගෙවා ඉන් අනතුරුව ඒවා ක්‍රීඩා අරමුදලට බැරවිය යුතුය:

(අ) කලින් කල මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා ආධාර වශයෙන් රජයෙන් දෙනු ලබන සියලුම මුදල් ;

(ආ) පළාත් සභාව විසින් කලින් කල මෙම ප්‍රඥප්තියේ කාර්ය සඳහා සම්මත කරනු ලබන සියලුම මුදල් ;

(ඇ) යම් තැනැත්තෙකු විසින් හෝ සංවිධානයක් විසින් මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා පරිත්‍යාග කරනු ලබන සියලුම මුදල් ; හා

(ඈ) වෙනත් යම් මාර්ගවලින් ක්‍රීඩා ගිණුමට ලැබෙන මුදල්.

(4) මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා අවශ්‍ය යැයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන හෝ මෙම ප්‍රඥප්තිය යටතේ වූ බලතල, කර්තව්‍ය සහ කාර්යය ක්‍රියාත්මක කිරීමේලා සහ ඉටුකිරීමේලා විධිමත් ලෙස දරන ලද වියදම් ආපසු ගෙවීම් සඳහා ක්‍රීඩා අරමුදලෙන් මුදල් ගෙවනු ලැබිය හැකිය.

(5) මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව යම් කාර්යයක් සඳහා යොදා ගැනීම පිණිස යම් නිශ්චල හෝ චංචල දේපළක් ප්‍රදානය කරනු ලැබුවහොත් අමාත්‍යවරයා විසින් ඒ දේපළ ක්‍රීඩා අරමුදල වෙනුවෙන් භාරගෙන පළාත් ක්‍රීඩා මණ්ඩලය නිර්දේශ කරන පරිදි අමාත්‍ය මණ්ඩලයට යොමුකර එකී තීරණය පරිදි ඒ දේපළ විකුණා ඒ විකිණීමෙන් ලැබෙන මුදල ක්‍රීඩා අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

(6) අමාත්‍යවරයාගේ පොදු හෝ විශේෂ විධිවිධානවලට යටත්ව අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ක්‍රීඩා අරමුදල නිසි පරිදි පරිපාලනය කළ යුතුය.

(7) ක්‍රීඩා අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

15. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියට අනුකූල විය යුතුය. ක්‍රීඩා අරමුදලේ පරිපාලනය.

16. (1) එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු හය මසක් ඇතුළත් වීමට පෙර ක්‍රීඩා ගිණුම් ලැබීම් සහ ක්‍රීඩා ගිණුමෙන් ගෙවීම් පිළිබඳ ප්‍රකාශයක් විගණනය සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. ක්‍රීඩා ගිණුම් විගණනය කිරීමේදී තමා සහාය වීමේ කාර්යය සඳහා විගණකාධිපතිවරයා විසින් සුදුසුකම් ලත් විගණකවරයෙකු හෝ විගණකවරුන් සේවයේ නියුක්ත කරගත හැකි අතර එසේ නියුක්ත කරනු ලබන විගණකවරයා හෝ විගණකවරුන් විගණකාධිපතිවරයාගේ විධානය හා පාලනය යටතේ ක්‍රියා කළ යුතුය. ක්‍රීඩා ගිණුම් විගණනය කිරීම.

(2) අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් ක්‍රීඩා ගිණුම් විගණනය කිරීමේදී තමා විසින් කරන ලද වියදම් පියවීමේ කාර්යය සඳහා විගණකාධිපතිවරයාට ගෙවිය හැක. එසේ ගෙවනු ලබන යම් පාරිශ්‍රමිකයකින්, ක්‍රීඩා ගිණුම් විගණනය කිරීමේ කාර්යය සඳහා තමා විසින් සේවයේ නියුක්ත කරන ලද විගණකවරයකුට හෝ විගණකවරුන්ට තමා විසින් ගෙවන ලද මුදල් අඩු කිරීමෙන් පසුව, ශේෂයක් වේ නම්, එය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය.

(3) ක්‍රීඩා ගිණුම් විගණනය කරන අතරතුර විගණකාධිපතිවරයාට හෝ ඒ සම්බන්ධයෙන් ඔහුට සහාය වන වෙනත් යම් තැනැත්තකුට හෝ එකී විගණනයේ කාර්යය සඳහා අවශ්‍ය යයි විගණකාධිපතිවරයා සලකන, ක්‍රීඩා ගිණුමට අදාළ සියලුම පොත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම් වවුචර් සහ වෙනත් ලේඛන පරීක්ෂාකර බැලීමට අයිතිවාසිකම් ඇති අතර ක්‍රීඩා ගිණුම් පරිපාලනය කරන නිලධාරියා විසින් එකී සියලු පොත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම්, වවුචර් සහ වෙනත් ලේඛන හෝ ක්‍රීඩා ගිණුම් පිළිබඳව තමාදන්නා වෙනත් තොරතුරු සැපයිය යුතුය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙකු හෝ,

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවනලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයෙකුව සිටින්නේද එමෙන්ම ගණකාධිකාරීවරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් හෝ අදහස් වේ.

17. (1) විගණකාධිපතිවරයා විසින් ක්‍රීඩා ගිණුම් පරීක්ෂාකොට තම වාර්තාවේ සඳහන් එකී ක්‍රීඩා ගිණුම පිළිබඳ විස්තර එකී ක්‍රීඩා ගිණුමේ කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ තත්ත්වය පිළිබිඹු කෙරෙන පරිදි දක්වා තිබේද යන වග සඳහන් කරමින් සහ එකී ක්‍රීඩා ගිණුමේ යම් කරුණක් ගැන පළාත් සභාවේ අවධානය යොමුවිය යුතුයයි විගණකාධිපතිවරයා අදහස් කරන විට ඒ කරුණ ද සඳහන් කරමින් වාර්තාව පිළියෙල කළ යුතුය. විගණකාධිපති වරයාගේ වාර්තාව.

(2) විගණකාධිපතිවරයා විසින් එකී තම වාර්තාව, විගණනයට භාජනය කරන ලද ක්‍රීඩා ගිණුමේ විස්තර ද සහිතව ඇස්තමේන්තුව සමග අමාත්‍යවරයා වෙත ඉදිරිපත්කළ යුතුය.

18. අමාත්‍යවරයා විසින් යම් ලිත් වර්ෂයක් අවසාන වීමෙන් පසු හැකිතාක් ඉක්මනින් ක්‍රීඩා ගිණුම පිළිබඳ පරිපාලන වාර්තාවක් ඒ වර්ෂය සඳහා ගිණුමේ විගණනය පිළිබඳ වාර්තාවේ පිටපතක් ද ඒ ගිණුම පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවද සමග සබරගමුව පළාත් සභාව හමුවේ තැබිය යුතුය. ක්‍රීඩා ගිණුම පිළිබඳ පරිපාලන වාර්තාව.

## III වන කොටස

### *ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම*

ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා වර්ගයක් නම් කිරීම

19. අමාත්‍යවරයා විසින් කරනු ලබන නියමයක් මගින් යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා වර්ගයක් පළාත් ක්‍රීඩාවක් හෝ පළාත් ක්‍රීඩා වර්ගයක් ලෙස නම් කරනු ලැබිය හැකි අතර, ඒ ක්‍රීඩාව හෝ ක්‍රීඩා වර්ගය සඳහා පළාත් සංගමයක් මැඟින් පිහිටුවිය හැකිය.

ක්‍රීඩා සංගම්

20. 19 වැනි වගන්තිය යටතේ යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා වර්ගයක් හෝ නම් කරනු ලැබූ අවස්ථාවක-

(1) එසේ නම් කරනු ලැබූ අවස්ථාවට පෙරාතුව සිට සංගමයක් පවතී නම්, එවැනි සංගමයක් මෙම ප්‍රඥප්තියෙහි මතුවට සඳහන් වෙන විධිවිධාන යටතේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ යුතුය.

(2) එසේ නම් කරනුලැබූ අවස්ථාවක, පසුව යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා වර්ගයක් හෝ පිළිබඳව යම් පළාත් සංගමයක් පිහිටුවනු ලැබුවහොත්, එසේ පිහිටුවනු ලැබූ දිනයේ සිට මාස තුනක කාලයක් ඉකුත් වීමට පෙර මෙම ප්‍රඥප්තියේ මතුවට එළඹෙන විධිවිධාන යටතේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ යුතුය.

ලියාපදිංචිය පිළිබඳ තීරණ වලට හා ක්‍රියා වලට විරුද්ධව අභියාචනා.

21. ලියාපදිංචිය පිළිබඳව යම් තීරණයකින් හෝ ක්‍රියාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් සමූහයක් හෝ විසින් ඒ තීරණවලට හෝ ක්‍රියාවට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. එම අභියාචනය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසාන තීරණය වන්නේය.

ක්‍රීඩා සංගම් පිළිබඳ ලියාපදිංචියේ සංයුතිය, සංස්ථාපනය, වගකීම්, බලතල හා කාර්යය සම්බන්ධව අමාත්‍යවරයා සතු බලතල ලියාපදිංචි කිරීම.

22. පහත දැක්වෙන කරුණු නියෝග මගින් නියම කළ හැකිය.

(1) ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීමේ කාර්යය පිළිපාටිය හා ඒවා ලියාපදිංචි කිරීම සඳහා අයකළ යුතු ගාස්තු

(2) සංගම්වල සංයුතිය හා සංස්ථාපනය

(3) ඒ සංගම්වල වගකීම් බලතල හා කාර්යය

(4) ඒ සංගම්වල තීරණවලට හෝ ක්‍රියාවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීමේ කාර්යය පටිපාටිය හා

(5) ඒ සංගම් විසින් පුහුණුකරුවන් තීරකයන් හා විනිසුරුවරුන් පත් කිරීමේ කාර්ය පටිපාටිය

ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම.

23. මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූල නොවන ක්‍රීඩා සංගමයක් ලියාපදිංචි කිරීම අත්හිටුවීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ හැකිය.

පහසුකම් ලැබීමට සුදුසුකම්.

24. මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි නොකරන ලද කිසිම ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා වර්ගයක් මෙම ප්‍රඥප්තිය යටතේ ලැබිය යුතු වූ ආධාර හෝ පහසුකම් හෝ වෙනත් ප්‍රදානයන්ට සුදුසුකම් නොලබයි.

පළාත් ක්‍රීඩා සංගම් ලියාපදිංචිය අත් හිටුවීම.

25. 19 වැනි වගන්තිය යටතේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් නොකළ හෝ ලියාපදිංචි කිරීම 22 වගන්තිය යටතේ අත්හිටුවනු ලබන යම් ක්‍රීඩා සංගමයක නිලධාරියෙකුට එම සංගමය සතු නිශ්චල හෝ චංචල දේපළ නියමිත කාලයක් තුළ තමා විසින් නම් කරනු ලබන නිලධරයෙකුට භාරදීමට කටයුතු කරන ලෙස අමාත්‍යවරයා විසින් නියම කළ හැකිය.

## IV වන කොටස

### *ක්‍රීඩා ශිෂ්‍යත්ව පිහිටුවීම*

ක්‍රීඩා ශිෂ්‍යත්ව.

26. (1) අමාත්‍යවරයා විසින් පහත සඳහන් අරමුණු සඳහා ක්‍රීඩා ශිෂ්‍යත්ව එකක් හෝ ඊට වැඩි ගණනක් ඇති කළ හැකිය.

(අ) ක්‍රීඩා ශාරීරික අභ්‍යාස අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම

(ආ) ක්‍රීඩා පිළිබඳ උපන් හපන්කම් ඇත්තවුන් සොයා ඔවුනට ඒවා දියුණු කර ගැනීමට අවස්ථාව සලසා දීම.

(2) පහත දැක්වෙන කරුණු නියෝග මගින් නියම කළ හැකිය.

(අ) උපරිම ක්‍රියාකාරිත්වය සඳහා විද්‍යානුකූල පුහුණුවීම් නිසි වයසේදී ලබාදීමට අවශ්‍ය පහසුකම් සැලසීම

(ආ) ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා තෝරා ගැනීම

(ඇ) ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම හා

(ඈ) මෙම කරුණු සඳහා සම්බන්ධීකරණ නිලධාරීන් ක්‍රීඩාචාර්යවරුන්, පුහුණුකරුවන්, ආචාර්යවරුන්, උපදේශකයින් හා වෙනත් නිලධාරීන් පත් කිරීම.

27. (1) නේවාසික හෝ වෙනත් ආකාරයේ පුහුණුවීම් සඳහා අවශ්‍ය පහසුකම් උපකරණ හා ගොඩනැගිලි සම්පාදනය කිරීමට සහ — පහසුකම් සැලසීමට අමාත්‍යවරයාට ඇති බලය.

(2) ඉහත (අ) ඡේදයේ පුහුණුවීම් පවතින ශිල්පායතන හෝ ආයතනයන්හි ශිෂ්‍යත්වලාභීන්ගේ විනය හා සුබසාධන කටයුතු ක්‍රමවත් කිරීමට.

අමාත්‍යවරයාට බලය ඇත්තේය.

28. (1) මෙහි මින්මතු "ක්‍රීඩා සංකීර්ණ" ලෙස හඳුන්වනු ලබන පුහුණු කටයුතු, තරඟ, ශාරීරික අභ්‍යාස, විනෝද ක්‍රීඩා ආදියට උනන්දු කරවීම, ඒවා ප්‍රගුණ කිරීම හා සංවර්ධනය කිරීම උදෙසා සංකීර්ණ ක්‍රීඩාංගන, ක්‍රීඩා පිට්ටනි පිහිටුවීමට හෝ පිහිටුවීමට අනුග්‍රහය ලබාදීමට අමාත්‍යවරයාට බලය ඇත්තේය. — ක්‍රීඩා සංකීර්ණ ආදිය පිහිටුවීම.

(2) (අ) ඉහත කී ක්‍රීඩා සංකීර්ණයන්හි පාලනය සඳහා කාර්මික හෝ වෙනත් නිලධාරීන් පත් කිරීම සහ වැටුප් ගෙවීම

(ආ) එකී ක්‍රීඩා සංකීර්ණයන්හි පහසුකම් සැපයීම

(ඇ) එකී ක්‍රීඩා සංකීර්ණයන්හි සවිකරන උපකරණ හෝ පාවිච්චි කිරීමේදී සැලසෙන ආරක්ෂාව පිළිබඳ තත්ත්වයන්

පිළිබඳ නියෝග සෑදිය හැකිය.

29. ඉහත 27 වැනි වගන්තියේ සඳහන් ආයතන පිහිටුවීම හෝ ඉදි කිරීම සඳහා ප්‍රතිපාදන ඒ ඒ ආයතන විසින් සපයාගත යුතුය. — අරමුදල් ප්‍රතිපාදන.

30. එකී ක්‍රීඩා සංකීර්ණයන්හි නේවාසික ගොඩනැගිලි සැපයීමට හෝ ඒවා ඉදි කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීමට හෝ ඒවාට උපකරණ සැපයීමට අමාත්‍යවරයාට බලය ඇත්තේය — ගොඩනැගිලි සැපයීමට අමාත්‍යවරයාට ඇති බලය.

## V වන කොටස

### *ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම*

31. (1) අමාත්‍යවරයා විසින් පහත සඳහන් කාර්යය සඳහා මෙහි මින් මතු "ශිල්පායතන" යනුවෙන් සඳහන් කරනු ලබන ක්‍රීඩා ශිල්පායතන එකක් හෝ වැඩි ගණනාවක් පිහිටුවනු ලැබිය හැකිය. — ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම.

(අ) ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන පිළිබඳ දැනුම, උපදෙස් හා පුහුණුව ලබාදීම

(ආ) එම ශිල්පායතනවල ශිෂ්‍යයන් විසින් ලබා ඇති ප්‍රවීණතාවය නිශ්චල කිරීම සඳහා විභාග පැවැත්වීම සහ

(ඇ) එම ශිල්පායතන විසින් පවත්වනු ලබන විභාගවලින් සමත් වූ අයට ඩිප්ලෝමා පිරිනැමීම හා සහතික පත්‍ර ප්‍රදානය කිරීම.

(2) පහත දැක්වෙන කරුණු අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කළ හැකිය.

(අ) ශිල්පායතනවලට ඇතුළත් කර ගැනීමේ පටිපාටි

(ආ) ඒ ශිල්පායතනවල අධ්‍යාපනය, පුහුණුව හා විභාග පිළිබඳ පටිපාටි සහ

(ඇ) අවශ්‍ය විය හැකි පරිදි ඒ ශිල්පායතනවලට අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන්, ගුරුවරුන්, උපදේශකයින් හා වෙනත් නිලධරයන් පත් කිරීම හා ඔවුන්ට වැටුප් ගෙවීම පිළිබඳ පටිපාටි.

ක්‍රීඩා ශිල්පායතන පහසුකම් ඇති කිරීම හා විනය පාලනය ආදිය සඳහා අමාත්‍යවරයා සතු බලය

32. අමාත්‍යවරයා විසින්

(1) ඒ ශිල්පායතනවලට පහසුකම් සැපයීම හා පුහුණුව සහ නේවාසික පහසුකම් හා ඒ ශිල්පායතනවල වෙනත් කාර්යයන් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම හා ඒවා නඩත්තු කිරීම හා උපකරණ සැපයීම

(2) ඒ ශිල්පායතනවල ශිෂ්‍යයින්ගේ සහ ආචාර්ය මණ්ඩලයේ විනය හා සුබසාධනය ඇති කිරීම හා විධිමත් කිරීම හා

(3) ඒ ශිල්පායතන මගින් ඩිප්ලෝමා හා සහතික ප්‍රදානය කිරීමට ද විධිවිධාන සැලැස්වීම.

කළ හැකිය

## VI වන කොටස

### *පොදු විධිවිධාන*

අමාත්‍යවරයාගේ සාමාන්‍ය හා විශේෂ විධිවිධාන

33. (1) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද මණ්ඩලවල, සංගම්වල හෝ වෙනත් සංවිධානවල ඵලදායී ක්‍රියාවේ යෙදවීමේ කාර්යයන් කිරීම හා වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ඒ ඒ මණ්ඩලය, සංගමය හෝ සංවිධාන වෙත පොදු හෝ විශේෂ හෝ ලිඛිත විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර ඒ මණ්ඩලය, සංගමය හෝ වෙනත් සංවිධානයක් විසින් ඒ ඒ විධාන ක්‍රියාවේ යෙදවිය යුතුය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද මණ්ඩලවල, සංගම්වල සහ වෙනත් සංවිධානවල හා දේපළ කටයුතු සම්බන්ධයෙන් වූ වාර වාර්තා ගණන් සහ වෙනත් තොරතුරු තමාට අවශ්‍යවිය හැකි ආකාරයෙන් තමාවෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් ඒ මණ්ඩලවලට, සංගම්වලට, සහ වෙනත් සංවිධානවලට කලින් කල විධාන කළ හැකි අතර, ඒ ඒ මණ්ඩල, සංගම් සහ වෙනත් සංවිධාන ඒ හැම විධානයක්ම අනුව ක්‍රියා කළ යුතුව ඇත.

(3) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද මණ්ඩල, සංගම්වල සහ වෙනත් සංවිධානවල කටයුතු සියල්ලම හෝ ඉන් යම් කමක් විසින් නියවිය කරනු ලැබූ තැනැත්තෙකු විසින් විමර්ශනය කරන ලෙසත්, අමාත්‍යවරයා විසින් කලින් කල නියම කළ හැකි අතර එසේ නියම කරනු ලැබූ කල්හි ඒ ඒ සෑම නියමයක්ම ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය විය හැකි සියලු පහසුකම් සැලැස්වීම සහ සියළු තොරතුරු සැපයීම ඒ මණ්ඩලය, සංගමය සහ වෙනත් සංවිධානයන් විසින් කළයුතු වේ.

නියෝග.

34. පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග පැනවිය හැකිය.

(1) සබරගමුව පළාත නියෝජනය වීම සඳහා ශ්‍රී ලංකාවේදී හෝ විදේශයන්හිදී ක්‍රීඩකයෙකු හෝ ක්‍රීඩා කණ්ඩායමකට සහභාගීවීම සහ පාලනය

(2) පළාත් පාලන ආයතන හෝ වෙනත් රාජ්‍ය අනුබද්ධිත ආයතන හෝ සේවා යෝජකයින් විසින් සැපයිය යුතු අවම ක්‍රීඩා හා විනෝද පහසුකම්.

(3) මේ ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ ඉගැන්වීමේ කාර්යය සඳහා හෝ නියෝග සෑදිය යුතුයැයි මලයදී ඇති වෙනත් සියලු කරුණු

(4) අමාත්‍යවරයා විසින් (1) වැනි වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ ඒ නියෝගයෙහි සඳහන් කර තිබිය හැකිවෙන පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතුය. අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම රජයේ ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි ඉක්මණින්ම අනුමැතිය සඳහා සබරගමුව පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එසේ අනුමත නොකළ දිනයේ සිට පරිච්ඡින්න වූ ලෙස සැලකිය යුතු නමුදු ඒ යටතේ කලින් කරන ලද යම් ක්‍රියාවකට ඉන් හානියක් නොවිය යුතුය. අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයේ නිවේදනය කරනු ලැබිය යුතුය.

35. මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලැබූ පළාත් ක්‍රීඩා මණ්ඩලයේ සාමාජිකයින්ට හා දිස්ත්‍රික් ක්‍රීඩා මණ්ඩල සාමාජිකයින්ට සබරගමුව පළාතේ අමාත්‍ය මණ්ඩලයේ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට හා ප්‍රමාණයට පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකිය. පාරිශ්‍රමික.

36. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියෙහි, අර්ථ නිරූපණය.

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයා සඳහන් වන්නේය.

"අමාත්‍යවරයා" යන්නෙන් සබරගමුව පළාතේ අමාත්‍ය මණ්ඩලයේ ක්‍රීඩා විෂයය භාර අමාත්‍යවරයා සඳහන් වන්නේය

"ලේකම්" යන්නෙන් සබරගමුව පළාත් අමාත්‍ය මණ්ඩලයේ ක්‍රීඩා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් අදහස් වන්නේය.

37. මෙම ප්‍රඥප්තියෙහි සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය. අනනුකූලතාවක් ඇති විටක සිංහල පාඨය බල පැවැත් විය යුතු බව.

05 - 228

---

## නිවැරදි කිරීමයි

### ප්‍රාදේශීය සභා පනතේ 122 (I) හා 126 (vii) උපඡේදයට අදාලවයි

හාලි-ඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ වාහන වලින් ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

2007.04.03 දින අංක 1491/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ IV (අ) කොටස - පළාත් සභා නිවේදන යටතේ ඉහත සඳහන් මාතෘකා යටතේ පළවූ අංක 340 දරන දැන්වීමෙහි සඳහන් මුද්‍රණ දෝෂ පහත සඳහන් ලෙස නිවැරදි විය යුතුය.

1 පිටුවෙහි 04 වන ඡේදයේ (අ) අනුඡේදයේ සඳහන් "ලැබූ" යන්න "ලැබ" ලෙස ද,

1 පිටුවෙහි 05 වන ඡේදයේ සඳහන් "සන්හයෙහි" යන්න "සන්හනයෙහි" ලෙස ද,

2 පිටුවෙහි 09 වන ඡේදයේ සඳහන් "ප්‍රකටම" යන්න "ප්‍රකටව" ලෙස ද,

2 පිටුවෙහි 15 වන ඡේදයේ සඳහන් "සිහිය දු" යන්න "සිහිය දී" ලෙස ද,

2 පිටුවෙහි 19 වන ඡේදයේ සඳහන් "රු. 750" යන්න "රු. 750/=" ලෙස හා "රු. 100" යන්න "රු. 100/=" ලෙස ද,

3 වන පිටුවෙහි 06 වන අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන උපලේඛන යටතේ (අ) උපලේඛනය, (ආ) උපලේඛනය, (ඇ) උපලේඛනය සහ (ඈ) උපලේඛනහි සඳහන් වන සියළුම ගාස්තු පහත දැක්වෙන උපලේඛනවල ආකාරයට නිවැරදි විය යුතු අතර (ආ) උපලේඛනයෙහි 4 වන ඡේදයේ සඳහන් "මෝටර් රථයක්" යන්න "මෝටර් කෝච් රථයක්" ලෙස හා 7 වන ඡේදයේ සඳහන් "මෝටර් රථයක්" යන්න "මෝටර් කෝච් රථයක්" ලෙස නිවැරදි විය යුතුය.

(06 වන අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන උපලේඛන)

(අ) උපලේඛනය

| | විස්තරය | ප්‍රථම ලියාපදිංචි ගාස්තුව | |
|---|---|---|---|
| 1. | ත්‍රිවීලරයක් සඳහා | රු. | 500.00 |
| 2. | වෑන් රථයක් හෝ කාරයක් සඳහා | රු. | 1,000.00 |
| 3. | මගීන් 26ක් / 26 කට අඩු සංඛ්‍යාවක් සඳහා බලපත්‍රයක් ලත් බස් රථයක්/ මෝටර් කෝච් රථයක් | රු. | 1,000.00 |
| 4. | සියළුම වර්ගයේ ටිපර් රථ හා ලොරි රථ හා ට්‍රැක්ටරයක් සඳහා | රු. | 1,500.00 |
| 5. | මගීන් 26කට වැඩියෙන් ගෙනයාම සඳහා බලපත්‍රයක් ලත් බස් රථයක්/ මෝටර් රථයක් | රු. | 2,000.00 |
| 6. | වෙනත් වාහන සඳහා | රු. | 2,000.00 |

(ආ) උපලේඛනය

| | විස්තරය | සාමාන්‍ය පළමු පැය හෝ ඉන් කොටසක් සඳහා අයකරන ගාස්තුව | | ගාස්තු අතිරේක සෑම පැයක් හෝ ඉන් කොටසක් සඳහා අය කරන ගාස්තුව | |
|---|---|---|---|---|---|
| 1. | යතුරු පැදියක් සඳහා | රු. | 5.00 | රු. | 2.00 |
| 2. | ත්‍රිවීලරයක් සඳහා | රු. | 5.00 | රු. | 2.00 |
| 3. | වෑන් රථයක්/කාරයක් සඳහා | රු. | 10.00 | රු. | 5.00 |
| 4. | මගීන් 26ක්/26කට අඩු සංඛ්‍යාවක් සඳහා මලපත්‍රයක් ලත් බස් රථයක්/ මෝටර් කෝච් රථයක් | රු. | 10.00 | | 5.00 |
| 5. | ට්‍රැක්ටරයක් | රු. | 15.00 | රු. | 10.00 |
| 6. | ලොරියක්/ටිපර් රථයක් සඳහා | රු. | 20.00 | රු. | 10.00 |
| 7. | මගීන් 26කට වැඩියෙන් ගෙනයාම සඳහා මලපත්‍රයක් ලත් බස් රථයක්/මෝටර් කෝච් රථයක් | රු. | 20.00 | රු. | 10.00 |
| 8. | වෙනත් වාහන සඳහා | රු. | 20.00 | රු. | 10.00 |

(ඇ) උපලේඛනය

| | විස්තරය | මාසික ගාස්තුව | |
|---|---|---|---|
| 1. | යතුරු පැදියක් සඳහා | රු. | 20.00 |
| 2. | ත්‍රිවීලරයක් සඳහා | රු. | 50.00 |
| 3. | වෑන් රථයක් / කාරයක් සඳහා | රු. | 75.00 |
| 4. | මගීන් 26ක් /26කට අඩු සංඛ්‍යාවක් සඳහා මලපත්‍රයක් ලත් බස් රථයක්/ මෝටර් කෝච් රථයක් සඳහා | රු. | 75.00 |
| 5. | සියලුම වර්ගයේ ටිපර් රථ හා ලොරි රථ හා ට්‍රැක්ටරයක් සඳහා | රු. | 100.00 |
| 6. | මගීන් 26කට වැඩියෙන් ගෙනයාම සඳහා මලපත්‍රයක් ලත් බස් රථයක්/ මෝටර් රථයක් | රු. | 150.00 |
| 7. | වෙනත් වාහන සඳහා | රු. | 150.00 |

(ඈ) උපලේඛනය

| | විස්තරය | වසරක් සඳහා | |
|---|---|---|---|
| 1. | වෙන්කරන ලද විශේෂ ස්ථානයක වර්ග අඩියක අයකරන ගාස්තුව | රු. | 35.00 |

එච්. එම්. ජයවීර බණ්ඩාර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
හාලි-ඇල.

2007 අප්‍රේල් මස 24 වැනි දින.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.